| විභාග අංකය : |
|---|
| |

# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

*දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍යය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2019

අප්‍රේල් - 2023

## BMGT E 1035 - ව්‍යාපාර ආර්ථික විද්‍යාව

කාලය : පැය 03 යි

<u>උපදෙස්:</u>

- මෙම ප්‍රශ්න පත්‍රය A කොටස, B කොටස සහ C කොටස යනුවෙන් කොටස් තුනකින් සමන්විතය.
- A කොටස අනිවාර්ය බහුවරණ ප්‍රශ්න 20 කින් සමන්විත වේ. එම ප්‍රශ්න සඳහා වඩාත්ම යෝග්‍ය පිළිතුර තෝරාගෙන එය මෙම පිළිතුරු ප්‍රශ්න පත්‍රයේම යටින් ඉරක් ඇඳ සලකුණු කරන්න. තවද ප්‍රශ්න පත්‍රයේ A කොටස විභාග ශාලාවෙන් පිටතට රැගෙනයාම සපුරා තහනම්ය.
- B කොටසෙහි හා C කොටසෙහි රචනා ශෛලියේ ප්‍රශ්න හයක් (06) ඇතුලත් වේ.
- B කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් (02) සහ C කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න එකක් (01) තෝරාගෙන ප්‍රශ්න **හතරකට (04)** පමණක් පිළිතුරු සපයන්න.
- ජංගම දූරකථන, ස්මාර්ට් පරිගණක හෝ වෙනත් අංකිත උපාංගයන් භාවිතා කිරීම තහනම් වේ.
- ගණක යන්ත්‍ර භාවිතයට ඉඩදෙනු ලැබේ.
- මුළු ලකුණු 100.

## A කොටස

1. සූක්ෂම ආර්ථික විද්‍යාව හා සාර්ව ආර්ථික විද්‍යාව අතර වෙනස වන්නේ,
   - අ) සූක්ෂම ආර්ථික විද්‍යාව, ජාතික විරැකියා අනුපාතය මත රජයේ බදු වල බලපෑම අධ්‍යයනය කරයි.
   - ආ) සාර්ව ආර්ථික විද්‍යාව තනි භාණ්ඩ හා සේවාවල මිල කෙරෙහි රජයේ නියාමනය සහ බදු වල බලපෑම අධ්‍යයනය කරන අතර සූක්ෂම ආර්ථික විද්‍යාව එසේ නොකරයි.
   - ඇ) සූක්ෂම ආර්ථික විද්‍යාව සමස්ථ ආර්ථිකය පිළිබඳ අධ්‍යයන කරන අතර සාර්ව ආර්ථික විද්‍යාව තනි ආයතනයක් පිළිබඳ අධ්‍යයන කරයි.
   - ඈ) සූක්ෂම ආර්ථික විද්‍යාව තනි පුද්ගලයන්ගේ සහ ආයතනවල තීරණ අධ්‍යයනය කරන අතර සාර්ව ආර්ථික විද්‍යාව සමස්ත ජාතික ආර්ථිකය අධ්‍යයනය කරයි.

2. ඔබ උපාධිය ලැබීමෙන් පසු, ප්‍රමුඛ ඇඟලුම් ආයතනයක මසකට රුපියල් 35,000 ක සේවයක් භාර ගැනීමට තීරණය කර ඇත. ඔබට ලැබුණු අනෙක් අවස්ථා දෙක වන්නේ රුපියල් 28,000කට සුපිරි වෙළඳසැලක සේවය කිරීම සහ රුපියල් 32,000කට විගණන ආයතනයක සේවය කිරීමයි. ඇඟලුම් සමාගමෙහි තනතුර භාරගැනීමේ ආවස්ථික පිරිවැය කොපමණද?
   - අ) විගණන ආයතනයක සේවය කිරීමේදී ඔබට ගෙවීමට නියමිත රුපියල් 32,000 සහ සුපිරි වෙළඳසැලක සේවය කිරීමේදී ඔබට ගෙවීමට නියමිත රුපියල් 28,000.
   - ආ) සුපිරි වෙළඳසැලක සේවය කිරීමේදී ඔබට ගෙවීමට නියමිත රුපියල් 28,000.
   - ඇ) ඇඟලුම් ආයතනයේ සේවය කිරීමේදී ඔබට ගෙවීමට නියමිත රුපියල් 35,000.
   - ඈ) විගණන ආයතනයක සේවය කිරීමේදී ඔබට ගෙවීමට නියමිත රු.32,000.

3. දෙනලද ආදායමක් ඇති පාරිභෝගිකයෙකු තම උපයෝගීතාව උපරිම කරනුයේ:
   - අ) පරිභෝජනය කරන සෑම භාණ්ඩයකින්ම ලැබෙන ආන්තික උපයෝගිතාවය ඒවායේ මිලට සමානුපාතික වන විටය.
   - ආ) පරිභෝජනය කරන එක් එක් නිෂ්පාදනයෙන් ලබාගත් ආන්තික උපයෝගීතාව ශුන්‍ය වන විටය.
   - ඇ) එක් එක් භාණ්ඩ වලින් ලබාගත් ආන්තික උපයෝගීතාව සමාන වන විටය.
   - ඈ) පරිභෝජනය කරන සෑම භාණ්ඩයකින්ම ලබාගත් මුළු උපයෝගීතාව සමාන වන විටය.

4. වෙළෙඳපොළක සැපයුම් ශ්‍රිතය Qs = -10 + 10P සහ ඉල්ලුම ශ්‍රිතය Qd=18 - 4P නම් සහ රජය රු.3 ක අවම මිලක් පැනවුවහොත් එහි ප්‍රතිඵලය කුමක් වේවිද?

අ) බලපෑමක් නැත.

ආ) ඒකක 14 ක හිඟයක් ඇති වේ.

ඇ) ඒකක 14 ක අතිරික්තයක් ඇති වේ.

ඈ) ඒකක 10 ක අතිරික්තයක් ඇති වේ.

5. භාණ්ඩයක මිල වැඩි වන විට එය මිලදී ගන්නා ප්‍රමාණය අඩු වනුයේ,

අ) සැපයුම් වක්‍රය ඉහළට බෑවුම් වන නිසා.

ආ) මිල වැඩිවීම නිසා මූර්ත ආදායම ඉහළ යන බව හැඟවෙන නිසා.

ඇ) පාරිභෝගිකයන් මිල ඉහළ ගිය භාණ්ඩ සඳහා වෙනත් භාණ්ඩ ආදේශ කරනු ඇති නිසා.

ඈ) පාරිභෝගිකයන් සාපේක්ෂව අඩු මිලක් සහිත භාණ්ඩයක් සඳහා සාපේක්ෂව ඉහළ මිලක් ඇති භාණ්ඩයක් ආදේශ කරයි.

6. මිල ඉල්ලුම් නම්‍යතාවය සහ ආදායම අතර සම්බන්ධය පිළිබඳ පහත සඳහන් කුමන ප්‍රකාශය **සත්‍ය ද** ?

අ) මිල ඉල්ලුම් නම්‍යතාවය අනම්‍ය නම් , මිල වැඩි වන විට ආදායම අඩු වේ.

ආ) මිල ඉල්ලුම් නම්‍යතාවය නම්‍ය නම්, මිල අඩු වන විට ආදායම වැඩි වේ.

ඇ) මිල ඉල්ලුම් නම්‍යතාවය අනම්‍ය නම්, මිල අඩු වන විට ආදායම වැඩි වේ.

ඈ) මිල ඉල්ලුම් නම්‍යතාවය නම්‍ය නම්, මිල වැඩි වනවිට ආදායම වැඩි වේ.

7. මුළු ඵලදායිතාවය උපරිම වන විට,

අ) ආන්තික ඵලදායිතාවය උපරිම වේ.

ආ) සාමාන්‍ය ඵලදායිතාවය උපරිම වේ.

ඇ) ආන්තික ඵලදායිතාවය ශුන්‍ය වේ.

ඈ) සාමාන්‍ය ඵලදායිතාවය ආන්තික ඵලදායිතාවය ට සමාන වේ.

8. පහත සඳහන් කුමන ප්‍රකාශය **සත්‍ය ද?**

අ) ආන්තික පිරිවැය සාමාන්‍ය පිරිවැයට වඩා වැඩි නම් සාමාන්‍ය පිරිවැය පහත වැටේ.

ආ) ආන්තික පිරිවැය සාමාන්‍ය පිරිවැයට වඩා වැඩි නම් සාමාන්‍ය පිරිවැය වැඩිවේ.

ඇ) ආන්තික පිරිවැය ධන නම් මුළු පිරිවැය උපරිම වේ.

ඈ) ආන්තික පිරිවැය සෘණ නම්, නිමැවුම වැඩි වුවහොත් මුළු පිරිවැය අඩු වන වේගයකින් වැඩි වේ.

9. ආයතනයක් ඒකක 200 ක් නිෂ්පාදනය කරන අතර මුළු නිෂ්පාදන පිරිවැය රුපියල් 4000 කි. ඔවුන් නිෂ්පාදනය 220 දක්වා වැඩි කරන විට පිරිවැය රුපියල් 4200 දක්වා ඉහළ යයි. සමාගම ශූන්‍ය නිමැවුමක් නිපදවන විට, පිරිවැය රුපියල් 1000 කි. ඔවුන් ඒකක 200ක් නිෂ්පාදනය කරන විට ඒකකයක විචල්‍ය පිරිවැය කොපමණද?

අ) රුපියල් 3200 කි.

ආ) රු.15 කි.

ඇ) රු.16 කි.

ඈ) රු.10 කි.

10. පූර්ණ තරඟකාරී ආයතනයක,

අ) ආන්තික ආදායම භාණ්ඩයේ මිල ඉක්මවයි.

ආ) මුළු ආදායම වෙනස් වීම, භාණ්ඩයේ මිල සහ භාණ්ඩයේ විකුණුම් ප්‍රමාණයේ වෙනසෙන් ගුණකල විට ලැබෙන අගයට සමාන වේ.

ඇ) ආන්තික ආදායම සාමාන්‍ය ආදායමට වඩා අඩුය.

ඈ) විකුණුම් ප්‍රමාණය දෙගුණ වන විට භාණ්ඩයේ මිල තියුනු ලෙස පහත වැටේ.

11. කෙටි කාලයේදී පූර්ණ තරඟකාරී ආයතනයක මිල, ආන්තික පිරිවැයට සමාන වන විට, එම ආයතනයේ නිමැවුම අඩු කළ යුත්තේ හෝ කෙටි කාලීනව වසා දැමිය යුත්තේ,

අ) මිල, සාමාන්‍ය මුළු පිරිවැයට වඩා වැඩි වන විටය.

ආ) මිල, සාමාන්‍ය මුළු පිරිවැයට වඩා අඩු වන විටය.

ඇ) මිල, සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා වැඩි වන විටය.

ඈ) මිල, සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා අඩු වන විටය.

12. පහත සඳහන් කුමන ප්‍රකාශය **නිවැරදි ද?**

අ) ඒකාධිකාරයක, වෙළඳපල ඉල්ලුම සහ ආයතනයේ ඉල්ලුම සමාන වේ.

ආ) ඒකාධිකාරී ආයතනයක් අලෙවි කරන භාණ්ඩය සඳහා පූර්ණ අනම්‍ය ඉල්ලුමක් ඇත.

ඇ) ආර්ථික ලාභයක් උපයා ගැනීමට ඒකාධිකාරය සහතික කර ඇත.

ඈ) ඒකාධිකාරය ආර්ථික සුබසාධනය අඩු නොකරයි.

13. පූර්ණ තරඟකාරී වෙළඳපලක් සහ ඒකාධිකාරී තරඟ වෙළඳපලක් අතර වෙනස දක්වන ප්‍රකාශය කුමක්ද?

අ) ඒකාධිකාරී තරඟකාරී වෙළඳපලක ආයතන, තම නිෂ්පාදනයේ මිල මෙන්ම එහි ගුණාත්මකභාවය සහ අලෙවිකරණය පදනම් කරගෙන තරඟ කරයි.

ආ) ඒකාධිකාරී තරඟකාරී වෙළඳපලට ඇතුල්වීම අවහිර කරනු නොලැබේ.

ඇ) පූර්ණ තරඟකාරී වෙළඳපලක ස්වාධීනව ක්‍රියා කරන විකුණුම්කරුවන් විශාල සංඛ්‍යාවක් ඇත.

ඈ) කෙටි කාලීනව ආර්ථික ලාභයක් උපයා ගත හැක්කේ ඒකාධිකාරී තරඟකාරී ආයතන වලට පමණි.

14. අංශ හතරක හෝ විවෘත ආර්ථිකයක් සඳහා සමතුලිතතාවය සඳහා වන කොන්දේසිය වන්නේ:

අ) ඉතුරුම් + බදු + ආනයන = ආයෝජන + රාජ්‍ය වියදම් + අපනයන

ආ) මුළු කාන්දුවීම් = මුළු විදීම්

ඇ) සමාහාර නිමැවුම = සමාහාර වියදම

ඈ) ඉහත සියල්ලම නිවැරදි වේ.

15. අවසාන භාණ්ඩ හා සේවාවල නිමැවුම පමණක් එකතු කිරීම වෙනුවට ආර්ථිකයේ සියලුම අංශවල සමස්ත නිමැවුම එකතු කළහොත් ජාතික ආදායම ඇස්තමේන්තු කිරීමේදී පැනනගින දෝෂය ලෙස හැඳින්වේ.

අ) ආදායම් දෝෂය

ආ) ද්වි ගණන දෝෂය

ඇ) ගණන් කිරීමේ දෝෂය

ඈ) ඇස්තමේන්තු දෝෂය

## B කොටස

**ප්‍රශ්න අංක 01**

ඇ) "සූක්ෂම ආර්ථිකවිද්‍යාව හා සාර්ව ආර්ථිකවිද්‍යාව ඉහළ විශ්වාසනීයත්වයකින් යුක්තව අනාගත අවිනිශ්චිතතාවයන් හා අවදානම් අඩුකරමින් වෙළඳපල තත්ත්වයන් අවබෝධකර ගැනීමට හා පුරෝකථනය කිරීමට උපකාරී වේ." ඉහත ප්‍රකාශය ආශ්‍රයෙන් ව්‍යාපාරික ආර්ථික විද්‍යාව කළමනාකරණ තීරණ ගැනීමේ ක්‍රියාවලියට දායක වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි)

ආ) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ආශ්‍රයෙන් පහත සිදුවීම් පැහැදිලි කරන්න.

i) සම්පත් උපයෝජනය වැඩිවීම.

ii) සංවර්ධිත රටවල් සමඟ ආණ්ඩුව නව වෙළඳ ගිවිසුම් අත්සන් කිරීම.

iii) තේ වගාවට වූ ස්වභාවික ආපදාවන් නිසා රුපියල් මිලියන 50 ක් වටිනා තේ ගස් කපා දැමීම.

(ලකුණු 06 යි)

ඇ) නිදහස් ආර්ථික වෙළඳපල ක්‍රමයක් තුල ආණ්ඩුවේ මැදිහත්වීම සාධාරණීයකරණය කළ හැකි හේතු මොනවාද?

(ලකුණු 08 යි)

**(මුළු ලකුණු 20 යි)**

**ප්‍රශ්න අංක 02**

අ) ඉල්ලුම වක්‍රය පහළට බෑවුම් වන්නේ ඇයි?

(ලකුණු 02)

ආ) 'සැපයුම් ප්‍රමාණයේ වෙනස' සහ 'සැපයුමේ වෙනස' අතර වෙනස්කම් දක්වන්න.

(ලකුණු 04)

ඇ) කිරි සඳහා ඇති ඉල්ලුම සහ සැපයුම පහත සමීකරණ මගින් නිරූපණය කරයි. P යනු කිරි ලීටරයක මිල වන අතර Q යනු **<u>මසක කිරි ලීටර ප්‍රමාණය දහස්වලින් (,000)</u>** නිරූපණය කරයි.

$$Qd = 100 - 6P$$

$$Qs = 28 + 3P$$

16. IS වක්‍රයේ සහ LM වක්‍රයේ සමතුලිත අවස්ථාවේදී,

ආ) මිල මට්ටම සහ උද්ධමන අනුපාතය තීරණය වේ.

ආ) පොලී අනුපාතය සහ මිල මට්ටම තීරණය වේ.

ඇ) ආයෝජන සහ මුදල් සැපයුම තීරණය වේ.

ඈ) පොලී අනුපාතය සහ නිමැවුම් මට්ටම තීරණය වේ.

17. IS-LM ආකෘතියේ, පොලී අනුපාතිකයේ අඩුවීම, ________ හි ප්‍රතිඵලයක් වනු ඇත.

අ) මුදල් සැපයුම වැඩි වීම

ආ) රජයේ මිලදී ගැනීම් වැඩි වීම

ඇ) බදු අඩු කිරීම

ඈ) මුදල් ඉල්ලුම වැඩි වීම

18. ව්‍යුහාත්මක විරැකියාව යනු

අ) ආර්ථික ව්‍යුහයේ වෙනස්කම් හේතුවෙන් ඇතැම් කර්මාන්තවල සැලකිය යුතු රැකියා අහිමිවීම් නිසා ඇතිවන විරැකියාව යි.

ආ) ආර්ථික අවපාතයන් වලදී ඇතිවන විරැකියාව.

ඇ) ශ්‍රම වෙළදපොලේ සාමාන්‍ය ක්‍රියාකාරිත්වය නිසා ඇතිවන විරැකියාව යි.

ඈ) මිනිසුන් රැකියාවක් සොයා ගැනීමේ අවස්ථා ගැන අධෛර්යමත් වන විට ඔවුන් රැකියාවක් සෙවීම නතර කිරීමයි.

19. පිලිප්ස් වක්‍රයට අනුව, විරැකියාව පහත වැටෙන විට:

අ) උද්ධමනය අඩු වේ.

ආ) උද්ධමනය නොවෙනස්ව පවතී.

ඇ) උද්ධමනය වැඩි වේ.

ඈ) නිමැවුම පහත වැටේ.

20. බොහෝ මුදල් ප්‍රමාණයක් ඉතා සුළු භාණ්ඩ ප්‍රමාණයක් පසුපස හඹා යන විට, උද්ධමනයේ විය හැකි ප්‍රතිඵලය ___________ ලෙස හඳුනා ගැනේ.

අ) අවධමනය

ආ) පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය

ඇ) ගොඩනගතලද උද්දමනය

ඈ) ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය (01 x 20 = මුළු ලකුණු 20)

i) කිරි සඳහා සමතුලිත මිල සහ ප්‍රමාණය ගණනය කරන්න.

(ලකුණු 02)

ii) කිරි ගොවීන්ට උපකාර කිරීම සඳහා රජය කිරි ලීටරයකට රුපියල් 10 ක අවම මිලක් නියම කරයි. වෙළඳපොලේ අලෙවි කරන නව කිරි ලීටර ප්‍රමාණය කොපමණද?

(ලකුණු 02)

iii) පාරිභෝගිකයින්ට විකිණීමට නොහැකි වූ අතිරික්ත කිරි ප්‍රමාණය රජය විසින් කිරි ලීටරයක් රු.10 බැගින් මිලට ගැනීමෙන් සහය දක්වන්නේ යයි සිතන්න. අතිරික්ත කිරි මිලදී ගැනීම සඳහා රජයේ වියදම ගණනය කරන්න.

(ලකුණු 02)

ඈ) ලැප්ටොප් වෙළඳපොල සමතුලිත මිල සහ ප්‍රමාණය කෙරෙහි පහත සිද්ධීන් වල බලපෑම සුදුසු රූප සටහන් භාවිතයෙන් පැහැදිලි කරන්න.

i) ලැප්ටොප් නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන අමුද්‍රව්‍ය වල මිල වැඩි වීම.

ii) මෘදුකාංග මිල අඩු වීම.

iii) ආර්ථික අවපාතය නිසා සාමාන්‍ය ආදායම අඩු වීම.

iv) COVID-19 වසංගතය හේතුවෙන් මාර්ගගත ඉගෙනීම වැඩි වීම.

(4 x 02 ලකුණු)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 03**

අ) "සම ආන්තික උපයෝගීතාවය" යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

(ලකුණු 06)

ආ) "කෙටිකාලීන නිෂ්පාදනයේදී අවම වශයෙන් එක් යෙදවුමක්වත් ස්ථාවර වන අතර ආයතනයට නිමවුම වැඩි කිරීමට අවශ්‍ය වන්නේ නම් එය කළ හැකි වන්නේ විචල්‍ය නිෂ්පාදන සාධක ප්‍රමාණය ඉහළ දැමීමෙනි."

ඉහත ප්‍රකාශය ඇසුරින් කෙටිකාලීන නිෂ්පාදනයේ ප්‍රශස්ථ අදියර කුමක්දැයි සුදුසු ප්‍රස්ථාර සටහන් යොදාගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඇ) පරිමාණානුකූල ඵල, පරිමාණානුකූල පිරිමැසුම් වලින් වෙන්කර දක්වන්න.

(ලකුණු 06)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 04**

අ) වෙළෙඳපොලක් පූර්ණ තරඟකාරීවීම සඳහා අවශ්‍ය උපකල්පන කවරේද? එම එක් එක් උපකල්පන වැදගත් වන්නේ ඇයිදැයි දක්වන්න.

(ලකුණු 06)

ආ) එක්තරා භාණ්ඩයක් සඳහා ඒකාධිකරුවකු මුහුණ දෙන ඉල්ලුම් ශ්‍රිතය පහත වේ.

$$P = 400 - 8Q$$

ආයතනයේ මුළු පිරිවැය ශ්‍රිතය

$$TC = 50 + 2Q^2$$

i) ආයතනයේ ලාභ උපරිම වන මිල හා නිමැවුම තීරණය කරන්න.

ii) එම නිමවුමේදී ලාභය කොපමණද?

(ලකුණු 08)

ඇ) කතිපයාධිකාරී වෙළඳපලක දැකිය හැකි විශේෂිත ලක්‍ෂණ මොනවාද? එය ඒකාධිකාරී තරඟ වෙළඳපලින් වෙනස් වන්නේ කෙසේද?

(ලකුණු 06)

**(මුළු ලකුණු 20)**

## C කොටස

**ප්‍රශ්න අංක 05**

අ) ජාතික ආදායම් ගණනය කිරීමේදී ද්විගණන දෝෂ මඟ හරවා ගන්නා ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ආ) ආදායම් ප්‍රවේශය භාවිතා කර පහත දත්ත ඇසුරින් වෙළඳපල මිලට දළ දේශීය නිෂ්පාදිතය($GDP_{MP}$) සහ වෙළඳපල මිලට දළ ජාතික නිෂ්පාදිතය ($GNP_{MP}$) සොයන්න. එය වියදම් ප්‍රවේශයෙන් ගණනය කරන ලද වෙළඳපල මිලට දළ දේශීය නිෂ්පාදිතය සහ වෙළඳපල මිලට දළ ජාතික නිෂ්පාදිතයට සමාන වන බව දක්වන්න.

| අයිතමය | වටිනාකම (රු. මිලියන) |
|---|---|
| පෞද්ගලික පරිභෝජනය | 7,314 |
| ක්ෂය වීම | 800 |
| වේතන | 6,508 |
| ශු. වක්‍ර බදු | 1,000 |
| පොලී | 1,060 |
| ආයෝජන | 1,442 |
| රාජ්‍ය වියදම් | 2,196 |
| කුලී ආදායම | 34 |
| ආයතනික ලාභය | 682 |
| අපනයන | 1,346 |
| විදේශ ශු. සාධක ආදායම | 40 |
| මිශ්‍ර ආදායම | 806 |
| ආනයන | 1,408 |

(ලකුණු 10)

ඇ) ශ්‍රී ලංකාවේ සේවා වියුක්තියට හේතු විස්තර කර ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති මට්ටම අඩු කිරීමට විසඳුම් ලබා දෙන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු20)

**ප්‍රශ්න අංක 06**

අ) කල්පිත ආර්ථිකයකට අදාලව පහත තොරතුරු ඔබ වෙත සපයා ඇත. (සියළුම වටිනාකම් රුපියල් මිලියන වලිනි.)

C = 250 + 0.75 yd (පාරිභෝජනය)

I = 300 - 25r (ආයෝජනය)

G = 200 (රාජ්‍ය වියදම)

T = 200 (බදු)

md = Y - 100 r (මුදල් ඉල්ලුම )

ms = 500 (මුදල් සැපයුම)

i) සමතුලිත ජාතික ආදායම (y) හා පොලී අනුපාතිකය (r) ගණනය කරන්න.

ii) ආර්ථික සමතුලිතයේදී පාරිභෝජනය, ආයෝජනය mt හා msp වටිනාකම් ගණනය කරන්න.

(ලකුණු 08)

ආ) IS - LM ආකෘතිය භාවිතයෙන් පහත සංසිද්ධීන්ගෙන් ආර්ථිකයට වන බලපෑම විමර්ශනය කරන්න.

i) මුදල් සැපයුම ඉහළ දැමීමට රජය තීරණය කිරීම.

ii) පාරිභෝජනය සඳහා වූ ඉහළ ඉල්ලුම.

(ලකුණු 06)

ඇ) "2022 සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ වාර්ෂික උද්ධමනය 69.8% දක්වා ඉහළ ගියේය". ශ්‍රී ලංකාවේ වර්තමාන ඉහළ උද්ධමන අනුපාතය සඳහ දායක වී ඇති හේතු විස්තර කරන්න

(ලකුණු 06)

**(මුළු ලකුණු 20)**